# සාරාංශය


# වංචාවක් නිරවුල් කිරීම

## කොළඹ හිල්ටන් හෝටලය ඉදිකිරිමේදී

## ශ්‍රී ලංකා රජයට සිදුවූ වංචාව

**Amazon Books – '*Colombo Hilton Hotel Construction - Fraud on Sri Lanka Government Vol. 3 - Settlement of a Fraud*'**

**http://www.consultants21.com/page-1-derivative-actions-in-law.php**




***විශාලත්වය- 8.25" X 11" - පිටු ගණන 776***

හිල්ටන් හෝටල් ව්‍යාපෘතිය මගින් රටට සහ මහජනතාවට සිදුවූ මහා පරිමාණ වංචාව මුල් කරගෙන, කර්තෘ විසින් රචිත තෙවැනි වෙළුම වන මෙම ග්‍රන්ථයේ සඳහන් වන කරුණු කාරණා අධ්‍යයනය කිරීමට පෙර, ඒ පිලිබඳව මනා අවබෝධයක් ලබා ගැනීම සඳහා ඔහු විසින් රචිත පළමුවන වෙළුම වන *'Colombo Hilton Hotel Construction - Fraud on Sri Lanka Government – Vol. 1 – Sri Lanka's First Derivative Action in Law* සහ දෙවන වෙළුම වන *'Colombo Hilton Hotel Construction - Fraud on Sri Lanka Government - Vol. 2 - Criminality Exposed, but Perversely Covered-up'* ග්‍රන්ථයන් අධ්‍යයනය කිරීම අත්‍යාවශ්‍ය වේ.

තෙවන ලෝකයේ සංවර්ධනය වෙමින් පවතින ස්වාධීන රාජ්‍යයන් සහ එහි ඉමහත් දිලිදුභාවයට පත් වී ඇති, මහජනතාව මත බලවත් රාජ්‍යයන් වල පාර්ශවකරුවන් විසින් කරනු ලබන ඉතාමත් දූෂිත මහා පරිමාණ වංචාවන්, එම දුගී දුප්පත් රාජ්‍යයන්ට බලපෑම් කරමින් ලැජ්ජා සහගත ලෙස යටපත් කර ගැනීමට, ඛේදජනක ලෙස ආර්ථික වශයෙන් ඉතාමත් බලවත් රාජ්‍යයන් නින්දිත ලෙස ක්‍රියා කර, එම දුගී දුප්පත් රාජ්‍යයන් තම වහල් භාවයට පත්කර ගෙන, ගැත්තන් කර ගැනීම යථාර්ථයක් ලෙස තැතිගැන්වෙන සුළු හෙලිදරව් කිරීම් වලින් මෙම ග්‍රන්ථය සමන්විත වේ.

ජපානයේ මිට්සුයි සහ සමාගම, තායිසේ සමාගම සහ ගෘහ නිර්මාණ ශිල්පීන් වන කැන්කෝ කිකාකු සෙක්කෙෂියා යොෂෝ ෂිබාටා සහ සමාගම, ඇමරිකා එක්සත් ජනපද හිල්ටන් ඉන්ටර්නැෂනල්හි තාක්ෂණික සහායකත්වය ලබමින්, ශ්‍රී ලංකා රජයේ ඇපකර මත, කොළඹ හිල්ටන් හෝටලයේ ඉදිකිරීම් සිදු කිරීමේදී, සිදු කළ මහා පරිමාණ දූෂිත වංචාව කර්තෘ විසින් මෙම ඉහත කී ග්‍රන්ථ දෙකෙන්ද, මෙම ග්‍රන්ථයෙන් සහ *Socio-Political Realities - Hilton Hotel Fiasco & Ad hominem Legislation - Expropriation Law* 'යන ග්‍රන්ථයෙන්ද, බිඳලිය නොහැකි සාක්ෂි සහිතව මනා සේ හෙළිදරව් කර ඇත.

තවද පැමිණිලිකාර කර්තෘගේ නීතිඥවරුන් විසින් ගරු නීතිපති සුනිල් ද සිල්වාට පහත ලිපිය පරිදි මෙම වංචාව පිළිබඳ දැනුම් දී, ඒ අනුව ලබා දෙන ලද ශ්‍රී ලංකා රජයේ ඇපකරයන් නීතිමය ලෙස අවලංගු වන හා ශූන්‍ය වන බැවින්, ඒ පිළිබඳව අදාළ එම ණය දුන් ආයතන වලට දැන්විය යුතු යැයි කියා සිටීමෙන්, භාණ්ඩාගාර ලේකම් ආර්. පාස්කරලිංගම් යථාර්ථය අවබෝධ කර ගෙන එහි සටහනක් තබන ලද්දේ *'මෙය අධ්‍යයනය කරන්න. මෙය අපේ ආධාර වලට බලපෑමක් ඇතිවිය හැකි බව ජපාන තානාපති මට දැනුම් දුන්නා'* යනුවෙනි.

**"ලිපි ශීර්ෂය**
**ද සිල්වා සහ පෙරේරා**

<u>ලියාපදිංචි තැපැල</u> 1991 නොවැම්බර් 12

ගරු. සුනිල් ද සිල්වා, ජනාධිපති නීතිඥ
නීතිපති
නීතිපති දෙපාර්තමේන්තුව
හල්ෆ්ඩොෆ් මාවත
කොළඹ 12

ගරු. මහතාණනි,

**<u>ඩී. සී. කොළඹ නඩු අංක 3155/ විශේෂිත</u>**

අපගේ කලින් සිදු කල ලිපි ගනුදෙනුවට අදාළව ක්‍රියාවෙහි යෙදීම සම්බන්ධයෙන් ලියා දන්වමි. ඉහත ක්‍රියාවට අදාළව 91.10.28 දිනැතිව උගත් දිස්ත්‍රික් විනිසුරු විසින් සිදු කල නියෝගයේ පිටපත් සහ ඒ අනුව 1 වන, 2 වන, 3 වන සහ 4 වන විත්තිකරුවන්ට එරෙහිව ලබා දුන් අතුරු තහනම් නියෝගයන්හි පිටපත් මේ සමඟ අමුණා එවමි.

ඔබ විසින්, උගත් දිස්ත්‍රික් විනිසුරුගේ නියෝගයෙහි අන්තර්ගතය පිළිබඳව, විශේෂයෙන්, වංචාකාරී කුමන්ත්‍රණය පිළිබඳ කාරණාව සම්බන්ධව ඔබගේ අවධානය යොමු කරනු ඇතැයිද, සහ බැලූ බැල්මට, අධිකරණය විසින් වංචා අවස්ථාව පිළිබඳ සංඥේයත්වය ගනු ලබන බැවින්, ඔබ විසින් ඒ අනුව, ශ්‍රී ලංකාවේ මහජනතාවගේ යහපත උදෙසා ගැටලුකාරී රජයේ ඇපකරයන් සම්බන්ධයෙන් පියවර ගනු ඇතැයිද, සහ එවැනි වංචා සහගත තත්වයක් යටතේ, නීතිය ඉදිරියේ එවැනි රජයේ ඇපකරයන් ශූන්‍ය සහ බල රහිත බව අදාළ පාර්ශවයන් වෙත දැනුම් දීමට කටයුතු කරනු ඇතැයිද අප විශ්වාස කරමු.

එසේම ඔබ විසින්, ජපානයේ එක්සිම් බැංකුව සහ වෙනත් දන්නා එකී ණය සඳහා සම්බන්ධිත මූල්‍ය සම්පාදකයින් වෙත ඒ අනුව දැනුම් දීමට සළකා බලන ලෙසද දන්වමු. එසේම අපගේ 90.09.26 දිනැති ලිපිය කෙරෙහි ඔබගේ කාරුණික අවධානය යොමු කරනු ලබන අතර, ඒ සම්බන්ධයෙන් ඔබ විසින් සුදුසු ක්‍රියාමාර්ග ගනු ඇතැයි විශ්වාස කරන්නෙමු.

කරුණාකර ලිපිය ලද බව දන්වන්න.

ඔබගේ හිතවත්

*(අත්සන)*
*නීතිඥ*

පිටපත : ලේකම්, මුදල් අමාත්‍යාංශය සහ ලේකම්, මහාභාණ්ඩාගාරය"

කර්තෘ විසින් කොළඹ හිල්ටන් හෝටලය හිමි සමාගම වන හොටෙල් ඩිවලොපර්ස් (ලංකා) සමාගමේ (HDL) කොටස්කරුවෙකු වශයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය අබියස මෙම මහා පරිමාණ දූෂිත වංචාව ප්‍රබල නඩුවක් මගින් සාර්ථක ලෙස සනාථ කර, දිසා අධිකරණය ලබාදුන් අතුරු තහනම් නියෝගද තහවුරු කරමින්, ජපන් සමාගම් වලට කිසිම ගෙවීමක්, HDL සමාගම සහ/හෝ ශ්‍රී ලංකා රජය මගින්, රජයේ ඇපකර මත, නොගෙවීමට නියෝගයක් පනවා තිබුණි. දිසා අධිකරණයට කර්තෘ විසින් ඉදිරිපත් කළ විචාරණ මාලාවන් සම්බන්ධව දිසා අධිකරණය විසින් නියෝගය දී තිබියදීත්, ජපාන් සමාගම්හට එම විචාරණ මාලාවන්ට පිළිතුරු දීමට අපොහොසත් වී තිබුණි.

එවැනි තත්වයක් මත, ඉහත කී ජපන් සමාගම් රාජත්‍රාන්ත්‍රික මට්ටමින් පුදුම සහගත අනිසි ලෙස කර්තෘගේ එම නඩුව සහ ඔහු විසින් ගොනුකර තිබූ ඊට අදාල අනෙක් නඩුවත් අස්කර ගන්නා ලෙස ශ්‍රී ලංකා රජයට බලකර සිටියේ, ශ්‍රී ලංකා රජයට සහ මහජනතාවට සිදුකල එම මහා පරිමාණ දූෂිත වංචාව මර්ධනය කර යටපත් කිරීම සඳහාය. ඒ අනුව ශ්‍රී ලංකා රජය දරිද්‍රතාවෙන් පෙළෙන ආර්ථික තත්වය පිළිබඳ සන්දර්භය තුළ අවාසනාවන්ත ලෙස අසරණ වී එම ජපන් රජයේ දැඩි බලපෑම් කිරීම් මත, එම ඉල්ලීමට යටත් වී, එම අවශ්‍යතාවය සපුරාලීමට සිදු වුයේ නූතන ලෝකයේ යථාර්ථය පිළිඹිබු කරන එක් අවස්ථාවක් පමණක් ලෙසිනි.

ශ්‍රී ලංකා ජපාන තානාපති මසාකි කුනියාසු විසින් 18.2.1983 දින දරණ පහත සදහන් ලිපිය පරිදි මුදල් අමාත්‍යාංශයේ ලේකම් අමතා ප්‍රකාශ කර සිටියේ තවදුරටත් ඒ නිරාකරණය කිරීම තත්වය කල්ගත වී නරක අතට පැමිණිලිකාර කතෘගේ නඩු වල නිශ්චිත විසදුමක් අවශ්‍ය බවය.

"ශ්‍රී ලංකා සමාජවාදී ජනරජයේ
ජපාන තානාපති කාර්යාලය
20, ග්‍රෙගරි පාර
කොළඹ 7

1993 පෙබරවාරි 18

ආර්. පාස්කරලිංගම් මහතා
ලේකම්
මුදල් අමාත්‍යාංශය
කොළඹ 1

හිතවත් පාස්කරලිංගම් මහතාණනි,

ඔබ විසින් ඊයේ දින පවත්වනු ලැබූ අති විශිෂ්ය දිවා ආහාර භෝජන ආගන්තුක සත්කාරයට මා බෙහෙවින්ම ස්තූති වන්ත වෙමි. අප දෙනෙ විසින් සිදු කරන ලද සාකච්ඡාවන් ඉතා සිත් ගන්නා සුළු, ප්‍රයෝජනවත් සහ ප්‍රතිඵලදායී වේ. කෙසේ වෙතත්, ජපානය සහ ශ්‍රී ලංකාව දෙරට සඳහාම වඩාත් ප්‍රයෝජනයත් විය හැකි එවැනි අනාගත සාකච්ඡාවන්, ඉදිරි වර්ෂ වලදී වඩාත් කලින් පවත්වනු ඇතැයි මා අපේක්ෂා කරන බව සඳහන් කරනු කැමැත්තෙමි.

මා විසින් ඔබ සමඟ සාකච්ඡා කල පොරොත්තු කරුණ සම්බන්ධයෙන්, එබ දිවයිනෙන් පිටව ගිය පසු කිසිදු ධනාත්මක තත්වයක් සිදු නොවනු ඇතැයි මට හැඟෙන බැවින්, ඔබ ජපානය සහ ඇමරිකා එක්සත් ජනපදය වෙත නික්ම යාමට ප්‍රථම, ඒ සඳහා ස්ථිරසාර බේරුම්කරණයක් පවතින්නේදැයි බැලීමට කටයුතු කිරීමට ඔබට හැකි නම් ඒ සම්බන්ධයෙන් බෙහෙවින් කෘතඥ වෙමි. තවද මෙම බේරුම්කරණය සිදු කිරීමට කල් ගත වන තරමටම එහි තත්වය නරක අතට හැරෙනු ඇති බව මා සඳහන් කිරීමට කැමැත්තෙමි.

සෑම අවස්ථාවකදීම ඔබගේ අවබෝධයට සහ ලැබෙන සහයෝගයට ස්තූති වන්ත වෙමි.

ඔබගේ විශ්වාසී

*(අත්සන)*
මසාකි කුනිසායු
ජපාන තානාපති"

ඉහත කී ජපන් රාජතාන්ත්‍රික බලපෑම්හි සන්දර්භය මත, ගරු නීතිපති ජනාධිපති නීතිඥ ටි.ජේ. මාරපන විසින් සමථ ගිවිසුම් සකස් කරනු ලැබූ අතර, එසේ කරන ලද්දේ ඔහු සහ ආර්. පාස්කරලිංගම් ඇතුළු භාණ්ඩාගාරයේ නිලධාරීන්ද, පැමිණිලිකාර කර්තෘ සහ ඔහුගේ නීතිඥවරුන් සමග සාකච්ඡා වට ගණනාවක් පවත්වා, භාණ්ඩාගාරයේ සහ නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ද, පැමිණිලිකාර කර්තෘ සහ ඔහුගේ නීතිඥවරුන් සමග ආරම්භයේදී, පූර්වයෙන් සාකච්ඡා සිදු කරනු ලැබ, *සැබවින්ම මහාපරිමාණ වංචාවක් සිදුවී ඇතැයි තහවුරු කර ගැනීමෙන් පසුවය.*

සමථයකට පත්වීම සඳහා වූ පැමිණිලිකාර කර්තෘගේ බලවත් ඉල්ලීම මත, මිට්සුයි සහ සමාගම සහ තායිසේ සමාගම විසින් අවුරුදු 8 ක් සඳහා එකතු වී ඇති පොලිය සහ හිල්ටන් හෝටලය ඉදිකිරීම් සඳහා දුන් ඔවුන්ගේ ණය සහ නැවත ප්‍රාග්ධන මුදලින් 30% කපා හැරීමටත්, එසේ කපා නොහැරිය ශේෂය ගෙවීම වාර්ෂික පොලිය 5.9% මත අවුරුදු 13 කාලයක් තුල කොටස් වශයෙන් නැවත ගෙවීමට එකඟ වී ඇති බවට පහත ලිපිය මගින්, කර්තෘ ඉදිරිපත් කළ ඉහත බේරුම්කරණ ගිවිසුම වල කෙටුම්පතෙහි සංස්ථාපිත කර තිබුණි.

**"ලිපි ශීර්ෂය**
**මුදල් අමාත්‍යාංශය**

1993 ජුනි 21

නිහාල් ශ්‍රී අමරසේකර මහතා
167/4, ශ්‍රී විපුලසේන මාවත
කොළඹ 10

හිතවත් මහතාණනි,

<u>හිල්ටන් හෝටලය - කෙටුම්පත් ගිවිසුම</u>

1993 ජුනි 17 දිනැති කෙටුම්පත් ගිවිසුම් අංක. 1, 2 සහ 3 හි පිටපත් මේ සමඟ යොමු කරමි.

93/6/11 දිනැති කෙටුම්පතෙහි වෙනස්කම් කිහිපයක් සිදු කර එකී ගිවිසුම්වල ඇතුලත් කර ඇත. එකී ගිවිසුම් යටින් ඉරි ගසා සහ කොළ පැහැයෙන් වර්ණ ගන්වා ඇත.

මෙම සංශෝධිත ගිවිසුම් මත ඔබගේ නිරීක්ෂණයන් ඉතා ඉක්මනින් ලබා ගන්නා ලෙස, භාණ්ඩාගාර ලේකම් විසින් මා වෙත උපදෙස් ලබා දී ඇත.

ඔබගේ හිතවත්

*(අත්සන)*
වී. එම්. වයි. වේසි වෙට්ටි මිය
භෞතික ප්‍රතිපත්ති සහ ආර්ථික කටයුතු
මුදල් අමාත්‍යාංශය"

කෙසේ වෙතත්, 1993 මැයි මස ත්‍රස්ත බෝම්බ ප්‍රහාරයකට ලක් වූ ජනාධිපති ආර්. ප්‍රේමදාසගේ අකල් වියෝවෙන් පසු, ජපන් රජයේ රාජතාන්ත්‍රික බලපෑම් මත, 1994 ජුනි මස ජනාධිපති ඩී. බී. විජේතුංග විසින් කර්තෘ හට සාකච්ඡාවකට ආරාධනා කර, ගරු නීතිපති ජනාධිපති නීතිඥ ටී. ජේ. මාරපන සමඟද සාකච්ඡා කොට, ඉහත සඳහන් නිරවුල අවසන් කිරීමට මහත් උත්සාහයක් දරා ඇත.

එනමුත්, එවැනි උත්සාහයන් අසාර්ථක වුයේ, මිට්සුයි සහ සමාගම සහ තායිසේ සමාගම ඉහතකී කපා නොහැරිය ඉතිරි ණය ප්‍රමාණය කොටස් වශයෙන් ආපසු ගෙවීම් සඳහා ශ්‍රී ලංකා රජයෙන් දුන් රජයේ ඇපකර වලට අමතරව, රජයෙන් පොරොන්දු පත්‍ර ඉල්ලා සිටීම හේතුවෙනි.

පැමිණිලිකාර කර්තෘ වෙත ගෙන එනු ලැබූ දරාගත නොහැකි පීඩනයන් හමුවේ, ඔහුට හෘදයාබාධයක් හට ගෙන ඇතැයි යන සැකය මත රෝහල්ගත වී පසුව විදේශගත වුයේ වෛද්‍ය පරීක්ෂණයකට භාජනය වීමටය. රෝහල්ගත වී සිටි අතර තුරද එවකට භාණ්ඩාගාර ලේකම් එන්.වී.කේ.කේ. වේරගොඩ විසින් නිරවුල් නිගමනයකට ඒමට පැමිණිලිකාර කර්තෘව සාකච්ඡාවක් සඳහා කැඳවීමට උත්සාහ කළ බැවින් පැමිණිලිකාර කර්තෘගේ බිරිඳ හට ලිපියක් මගින් පැමිණිලිකාර කර්තෘගේ මෙම තත්වය පිළිබඳව ජනාධිපති ඩී. බී. විජේතුංගට දැණුම් දීමට සිදුවීය.

තවදුරටත් එළිදරව් වන්නේ, පැමිණිලිකාර කර්තෘ මත අනිසි පීඩන ඇති කිරීමට ද්වේශ සහගත ලෙස පදනම් විරහිතව නිතීමය පියවර ගෙන, පැමිණිලිකාර කර්තෘට එරෙහිව සාවද්‍ය සහ ද්වේශසහගත නඩුවක් හොටෙල් ඩිවලොපර්ස් (ලංකා) සමාගම නමින් පැනවීමත් වන අතර, මෙම වංචාව පිළිබඳ නිවැරදි කරුණු හෙළිදරව් වීමත් සමගම, රජය, ජපන් සමාගම් සහ HDL සමාගම විසින් පැමිණිලිකාර කර්තෘ වෙත ලිඛිතව ඔවුන්ගේ කණගාටුව ප්‍රකාශ කරමින් පැමිණිලිකාර කර්තෘ ගෙන් සමාව අයැද සිටි

අතර, HDL සමාගම පැමිණිලිකාර කර්තෘ සමග මේ සම්බන්ධව වෙනම බේරුම්කරණ ගිවිසුමක් අත්සන් කරන ලදී.

1994 වසරේ ශ්‍රී ලංකා රජයේ වෙනසත් සමගම, මෙම දැවැන්ත වංචාව සම්බන්ධයෙන් විමර්ශනය කිරීම සඳහා ජනාධිපතිනිය චන්ද්‍රිකා කුමාරතුංග විසින් විශේෂ ජනාධිපති කොමිසමක් පත් කරන ලදී. එම විශේෂ ජනාධිපති කොමිසමට සහාය දීමට ශ්‍රී ලංකා පොලිසියේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව, සොලිසිටර් ජෙනරාල් සහ නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරින්ද සම්බන්ධ කර ගන්නා ලදී.

කර්තෘ ඇතුළුව, සාක්ෂිකරුවන් 24 දෙනෙකුගෙන් සාක්ෂි ලබාගෙන, ත්‍රිපුද්ගල ගෘහ නිර්මාණ ශිල්පින්ගේ විමර්ශන වාර්තවක්ද ලබා ගෙන, එම ලබාගත් සාක්ෂි අනුව විශේෂ ජනාධිපති කොමිසම සෑහීමට පත්වී, පුද්ගලයන් හතර දෙනෙකුට එරෙහිව, රජයට මහා පරිමාණ වංචාවක් කල බවට වන චෝදනාව මත, 1995 දෙසැම්බර් මස චෝදනා පත්‍ර නිකුත් කර ඇත.

මිට අදාළව පහත සඳහන් මහජන ප්‍රකාශය අධිකරණ අමාත්‍ය ජී. එල්. පීරිස් විසින් කර තිබුණි:

> “ජපන් කොන්ත්‍රාත්කරුවන් සමග සමථයට අත්සන් තැබීම කර ඇත්තේ මහජන සන්ධාන රජයේ මැතිවරණ ප්‍රකාශනයක් සහ ආණ්ඩුවේ කැපවීම මත ජාතික සම්පත් කොල්ලකෑම සහ මංකොල්ලයට එරෙහිව සටන් වැද මහා පරිමාණයේ ඉතිරියක් සිදු කර ඇත. එසේම මෙය දඩුවම් ලැබිය යුතු ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් නොවන අතර විශේෂ ජනාධිපති කොමිසම විසින් නිතීමය ලෙස දූෂණය සහ වංචාවට එරෙහිව වැරදිකරුවන්හට ගනු ලබන පියවරක් විය.”

කෙසේ වෙතත්, ඊට අනනුකූල නොවූ යථාර්ථයට පටහැනිව අධිකරණ අමාත්‍ය ජී. එල්. පීරිස් විශේෂ ජනාධිපති කොමිසමේ පරීක්ෂණය පසුව කඩාකප්පල් කර තිබුණු බව - *‘Colombo Hilton Hotel Construction - Fraud on Sri Lanka Government - Vol. 2 - Criminality Exposed, but Perversely Covered-up’* කර්තෘගේ ඉහතකී සාරාංශයෙන්ද හෙළිදරව් වේ.

තවද ගරු නීතිපති ජනාධිපති නීතිඥ ෂිබ්ලි අසිස් විසින් 1993 ජුනි මස සකස් කළ එම කෙටුම්පත් සමථ ගිවිසුම් මත, ජනාධිපති කොමිසමට සොලිසිටර් ජෙනරාල් ජනාධිපති නීතිඥ පී. එල්. ඩී. ප්‍රේමරත්න විසින් ඉදිරිපත් කිරීමෙන් පසු, එම කොමිසම එම සමථ ගිවිසුම් පිළිබඳ පැමිණිලිකාර කර්තෘ ගෙන් කරුණු කරණා විමසා, එම සමථ ගිවිසුම් අත්සන් කිරිමට විශේෂ ජනාධිපති කොමිසම විසින් අවසර ලබා දෙන ලදී. එම සමථ ගිවිසුම් වලට පාර්ශවකරුවන් වුයේ ශ්‍රී ලංකා රජය වෙනුවෙන් භාණ්ඩාගාර ලේකම්, ජපානයේ මිට්සුයි සහ තායිසේ සමාගම් සහ හිල්ටන් හෝටලය හිමි සමාගම වූ හොටෙල් ඩිවලොපර්ස් (ලංකා) සමාගම සහ පැමිණිලිකාර කර්තෘය.

පහත සඳහන් වන්නේ 21.6.1995 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශයක *'උධෘත'*:

**1995.06.30 දිනට ප්‍රකාශිත සමස්ථ ගෙවිය යුතු වටිනාකම - (ජපානයේ මිට්සුයි සහ සමාගම සහ තායිසේ සමාගම වෙත)**

| | ජපන් යෙන් මිලියන | ඇමරිකානු ඩොලර් මිලියන @ යෙන් 85/ඇ.ඩො. | ශ්‍රී ලංකා රුපියල් මිලියන @ රු. 0.58 /යෙන් |
|---|---|---|---|
| ඉදිකිරීම් ශේෂය සහ ගෘහභාණ්ඩ, වැද්දුම් සහ උපකරණ වියදම් | 1,400 | 16 | 812 |
| දිගු කාලීන ණය | 12,300 | 145 | 7,134 |
| 1999 දී සම්පූර්ණයෙන්ම ගෙවා ඇති | 13,700 | 161 | 7,946 |
| ඉදිකිරීම් ශේෂය සහ ගෘහභාණ්ඩ, වැද්දුම් සහ උපකරණ වියදම් මත පොළිය | 1,562 | 18 | 906 |
| දිගු කාලීන ණය මත පොළිය | 7,617 | 90 | 4,418 |
| නොගෙවීම් සඳහා කල් ඉකුත් වූ පොළිය | 4,827 | 57 | 2,800 |
| පසුගිය රක්ෂණ වාරික | 87 | 1 | 50 |
| | 14,093 | 166 | 8,174 |
| **සමස්ථ ගෙවිය යුතු වටිනාකම** | 27,793 | 327 | 16,120 |

**බේරුම්කරණය මත කපා හැරීම් (නිහාල් ශ්‍රී අමරසේකරගේ බලකිරීම මත)**

| | ජපන් යෙන් මිලියන | ඇමරිකානු ඩොලර් මිලියන @ යෙන් 85/ඇ.ඩො. | ශ්‍රී ලංකා රුපියල් මිලියන @ රු. 0.58 /යෙන් |
|---|---|---|---|
| 30% ඉදිකිරීම් ශේෂය සහ ගෘහභාණ්ඩ, වැද්දුම් සහ උපකරණ වියදම් | 420 | 5 | 244 |
| 30% දිගු කාලීන ණය | 3,690 | 43 | 2,140 |

| | | | |
|---|---|---|---|
| | 4,110 | 48 | 2,384 |
| කල් ඉකුත් වූ පොළිය | 4,827 | 57 | 2,800 |
| 1984 න් ආරම්භ වී 1995 ජූනි 30 තෙක් | | | |
| සාමාන්‍ය පොළිය | 7,617 | 90 | 4,418 |
| ඉදිකිරීම් ශේෂය සහ ගෘහභාණ්ඩ, | | | |
| වැද්දුම් සහ උපකරණ වියදම් මත පොළිය | 1,562 | 18 | 906 |
| පසුගිය රක්ෂණ වාරික – 30% කපා හැරීම් | 26 | 0 | 15 |
| <u>අඩු කලා</u> පසුගිය වර්ෂ දෙක සඳහා වාර්ෂික සාමාන්‍ය පොළි අනුපාතය @ 3% - එනම් 1993 ජුලි - 1995 ජුනි දක්වා ජපන් යෙන් මිලියන (9590-312) ක අඩුකල ප්‍රාග්ධන ශේෂය මත | (556) | (7) | (322) |
| | 13,476 | 159 | 7,816 |
| සමස්ථ කපා හැරීම් | 17,586 | 207 | 10,200 |

**බේරුම්කරණය අනුව 1995.06.30 දිනට ගෙවිය යුතු ශේෂය**

| | ජපන් යෙන් මිලියන | ඇමරිකානු ඩොලර් මිලියන @ යෙන් 85/ඇ.ඩො. | ශ්‍රී ලංකා රුපියල් මිලියන @ රු. 0.58 /යෙන් |
|---|---|---|---|
| ප්‍රාග්ධනය - ඉදිකිරීම් සහ ගෘහභාණ්ඩ, වැද්දුම් සහ උපකරණ | 980 | 12 | 568 |
| දිගු කාලීන ණය | 8,610 | 101 | 4,994 |
| | 9,590 | 113 | 5,562 |
| <u>එකතු කිරීම්</u> | | | |
| පසුගිය වර්ෂ දෙක සඳහා වාර්ෂික සාමාන්‍ය පොළි අනුපාතය @ 3% - එනම් 1993 ජුලි - 1995 ජුනි දක්වා ජපන් යෙන් මිලියන (9590-312) ක අඩුකල ප්‍රාග්ධන | 556 | 7 | 322 |
| | 10,146 | 119 | 5,885 |
| අඩු කිරීම් | | | |
| -1990 මැයි මිට්සුයි / තායිසෙයි වෙත ගෙවීම් – නමුත් 1990 සැප්තැම්බර් මස අතුරු තහනම් නියෝග මත අත් හිටුවන ලදී. | 312 | 4 | 181 |

| | | | |
|---|---|---|---|
| - අතුරු තහනම් නියෝගය මත සමාගම තුල සමුච්චිත මුදල් වලින් | 2,000 | 24 | 1,160 |
| | 2,312 | 27 | 1,341 |
| බේරුම්කරණය අනුව1995.06.30 දින වන විට ශුද්ධ අඩුකල ශේෂය | 7,834 | 92 | 4,544 |

එම සමථ ගිවිසුම් වල එලිදරව් කර ඇති පරිදි, පැමිණිලිකාර කර්තෘගේ ඍජු ස්ථාවරය මත, 1995 ජුනි මස මෙම ජපානයේ මිට්සුයි සහ තායිසේ සමාගම් විසින් ශ්‍රී ලංකා රජයෙන් ඉල්ලා සිටි මුදලෙන් ප්‍රාග්ධන කොටසෙන් 30% කපාහැරිම සහ අවුරුදු 10 ක කාලයක තුල එකතු වී තිබු පොලියද කපා හැරීම සහ ඉතුරු කපා නොහැරිය ප්‍රාග්ධන කොටස නැවත උපලේඛනයකර තවත් වසර 16 කට 5.25% ක් අඩු පොලියකට කොටස් වශයෙන් ගෙවීමට දිර්ස කිරීමට එකගවී තිබුණි. මෙය ශ්‍රී ලංකා රජයේ ඇපකර මත, මෙම ජපන් සමාගම් ඉල්ලා සිටි මුදලෙන් 62% ක කපා හැරීමකි. එය එම අවස්ථාවේදී යෙන් මිලියන 17,586 නොහොත් ඇමරිකන් ඩොලර් මිලියන 207 වූ අතර ශ්‍රී ලංකා මුදලින් රු. මි. 10,200 විය.

සමථ ගිවිසුම් වල දක්වා ඇති පරිදි, ශ්‍රී ලංකා රජයට පැමිණිලිකාර කර්තෘගේ ඉහතකී මෙහෙවරින් HDL සමාගමට සහ ශ්‍රී ලංකා රජයට විශාල වාසියක් අත්වූ බව පිළිගෙන ඇත. මෙම කපා හැරීම 2016.6.30 දිනට මහා බැංකුවේ පොලී අනුපාතය අනුව රු. මි. 89,177.3 වූ අතර, දීර්ස කළ ඉතිරි ශේෂය රු. මි. 51,451.8 විය.

ඒ අනුව විශේෂ ජනාධිපති කොමිසමේ සහ අමාත්‍ය මණ්ඩලයේ අනුමැතියට පසුව එවකට භාණ්ඩාගාරයේ ලේකම් ඒ. එස්. ජයවර්ධන ශ්‍රී ලංකා රජය වෙනුවෙන් කටයුතු කරමින් 1995.6.28 දින, ගරු නීතිපතිතුමා විසින් පහත සදහන් ලිපිය පරිදි සකස් කර අනුමත කළ සමථ ගිවිසුම් නිල වශයෙන් අත්සන් කර ක්‍රියාත්මක කරන ලදී.

"ලිපි ශීර්ෂය
නීතිපති දෙපාර්තමේන්තුව

1995 ජූනි 15

ඒ. එස්. ජයවර්ධන මහතා
ලේකම්
මුදල්, ක්‍රම සම්පාදන, ජනවාර්ගික කටයුතු සහ
ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය

<u>හොටෙල් ඩිවෙලොපර්ස් (ලංකා) ලිමිටඩ්</u>

ඉහත සමාගමට අදාළව බේරුම්කරණ කෙටුම්පත් ගිවිසුම්හි පිටපත් එවනු ලැබූ ඔබගේ 1995 ජූනි 9 දිනැති ලිපියට යොමුවයි.

බේරුම්කරණ කෙටුම්පත් ගිවිසුම් නියම පිළිවෙලට පවතින බව මාගේ නිගමනයයි.

*(අත්සන)*
පී. එල්. ඩී. ප්‍රේමරත්න
වැඩ බලන සොලිස්ටර් ජනරාල්
නීතිපති වෙනුවට"

ඉහතකී සමථය මහත් උත්කර්ෂවත් අන්දමින් මාධ්‍ය සමුළුවේදී අනාවරණය කර තිබුණේ අධිකරණ අමාත්‍ය සහ නියෝජ්‍ය මුදල් අමාත්‍ය ජී.එල්. පීරිස්, විදේශ අමාත්‍ය ජනාධිපති නීතිඥ ලක්ෂ්මන් කදිරගාමර් සහ යසාඕ නාගුචි, ශ්‍රී ලංකා ජපන් තානාපතිද එම සමුළුවට සහභාගී වීමෙන්ය. පුදුමාකාර ලෙස ඔවුන් සියළු දෙනාම ශ්‍රී ලංකා රජයට සහ මහජනයාට සිදුකළ ඉහතකී මහාපරිමාණ වංචාව 'හුදු ආරවුලක්' සහ 'උත්කෝපකයක්' බව පවසා, මෙය ශ්‍රී ලංකාව සහ ජපානය අතර තිබූ සම්බන්ධතාවයට බාධාවක්ව තිබූ බව සඳහන් කර ඇත.

ඉහතකී සමථ ගිවිසුම් වල හිල්ටන් හෝටලය අයිති HDL සමාගම තවදුරටත් මූල්‍යමය වශයෙන් ප්‍රතිසංස්කරණ කිරීමට කොන්දේසි ගණනාවක් අඩංගු කොට තිබුණි. තවද එහි එක් කොන්දේසියක් වූයේ, පහත දැක්වූ පරිදි සුරකුම්පත් විනිමය කොමිෂන් සභාවට අදාළ ඔවුන්ගේ ව්‍යවස්ථාපිත යුතුකම් හා වගකීම් පැහැර හැරීම මත, මෙම මහත් වංචාව කොටස් වෙළඳපොලේ ලැයිස්තුගත පොදු සමාගමක් වූ HDL සමාගම සම්බන්ධයෙන් ක්‍රියා නොකිරීම පිළිබඳ සුරකුම්පත් විනිමය කොමිෂන් සභාවේ සාමාජිකයන්ට එරෙහිව නීතිමය පියවර ගැනීමට රජය එකඟවීමය.

> "5. එච්ඩීඑල් සමාගමේ කාරණා සම්බන්ධයෙන් අමරසේකර මහතා විසින් ඒ ඒ ආයතන වලට කරණ ලද නියෝජන වලට අදාලව ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ සහ/හෝ එහි සාමාජිකයන්ගේ සහ කොළඹ කොටස් හුවමාරු ස්ථානයේ සහ/හෝ එහි අධ්‍යක්ෂවරයන්ගේ ක්‍රියාකලාපය හා ක්‍රියා ගැන රජය විසින් යෝග්‍ය හා ස්වාධීන ක්‍රියාමාර්ගයක් ගත යුතුය. තවද, ඒ කාරණා ගැන තමා විසින්ම තවදුරටත් ක්‍රියා කිරීමේ අයිතියද, අමරසේකර මහතා වෙතම තබා ගනු ලැබේ."

මෙම සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ සාමාජිකයින් අතර, ශ්‍රී ලංකා අධිකරණ අමාත්‍ය වන ජී. එල්. පීරිස්ද එවකට එහි සාමාජිකයකු හැටියට ශ්‍රී ලංකා රජයට සහ මහජනතාවට සිදුකල මෙම මහාපරිමාණ වංචාව යටපත් කිරීමේ වරදට හසුවී සිටි එක් පුද්ගලයෙක් විය. එළිදරව් වන පරිදි එකළ නීතිපති දෙපාර්තමේන්තුවේ රජයේ නීතිඥයෙකු සිටි නීතිඥ අරිත ආර්. වික්‍රමරත්න මෙය මහාපරිමාණ වංචාවක් යයි පිළිගෙන තිබූ නමුත්, පසුව ඔහු සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් ලෙස නිලය දරූ පසු මෙම මහාපරිමාණ වංචාව පිළිබඳ කිසිදු පියවරක් ගැනීමට අසමත්ව එය පැහැර හැර තිබුණි. තවදුරටත් එළිදරව් වුයේ මේ පිළිබඳ ඔහු වෙත යොමු කළ ලිපි වලටද ප්‍රතිචාර නොදක්වා තිබුණ බවය.

අධිකරණ අමාත්‍ය ජී. එල්. පීරිස් කලින් මෙම සමථ ගිවිසුම් තමා විසින් සිදු කළ හැටියට රඟපාමින් නම්බු නාම ලබා ගැනීම සඳහා ප්‍රශංසා කරමින් කියා තිබුණේ "*අද ප්‍රීතිමත් දවසක්. කොළඹ හිල්ටන් හෝටලයේ ආරවුල විසඳුමකට අපි ලගා විය*" යනුවෙන්ය. එනමුත් සමථ ගිවිසුම් වල ඉහත කොන්දේසිය ඔහු විසින් දැනගත් විගස, ඔහු වහාම මෙම සමථ ගිවිසුම් දෝෂාරෝපණය කොට ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ සහ ඉන් පිටත ද මහා අදෘශ්‍යමාන ආන්දෝලනයක් ඇති කර තිබුණි.

අධිකරණ අමාත්‍ය ජී. එල්. පීරිස්ගේ එම ඊර්ෂ්‍යා සහගත, ද්වේෂසහගත සාවද්‍ය ප්‍රකාශ සහ ඔහුගේ හැසිරීම හා ක්‍රියාදාමයන් මත, මෙම සමථයට විරුද්ධව සිටි පාර්ශවකරුවන් විසින් නඩු ගණනාවක් මෙම සමථ ගිවිසුම් වලට එරෙහිව ගොනු කළ අතර, එම නඩු සියල්ල පසුව නිශ්ප්‍රභා විය. සමථ ගිවිසුම් වල නිශ්චිත වශයෙන් අඩංගු කර තිබු කොන්දේසියක් මත, හිල්ටන් හෝටලය අයිති HDL සමාගම නැවත මුලා වශයෙන් ප්‍රතිසංස්කරණය කිරීමේ කටයුත්ත සම්පූර්ණයෙන්ම බිඳ වැටීමකට ලක් වී, එම සමාගම මුලා අර්බුදයකට ගොදුරු වී ඇත - *එනම් :* සමථ ගිවිසුම් අංක 2

“14. හෝටලයෙහි හෝටල් කාමර සහිත තෙවන කුළුණ ගොඩ නැඟීම සඳහා වන සාධ්‍යතාව සෝදිසි කර බැලීම සහ හිමිකම් හරහා මූල්‍ය කටයුතු සිදු කිරීම සළකා බැලීම සහ / හෝ එහි නව කොටස් හෝ වෙනත් කරුණු හේතුවෙන් ඇතිවන නව ගැටලු වලදී සාධ්‍ය ලෙස සළකා බැලීමට සහ එමගින්, හොටෙල් ඩිවෙලොපර්ස් (ලංකා) පෞද්ගලික සමාගමෙහි (HDL) ලාභ ඉපයීම් සහ ණය සේවා හැකියාව වර්ධනය කර එමගින්, ඉහත සඳහන් කල පරිදි මිට්සුයි සහ සමාගමට සහ / හෝ රජය වෙත ගෙවීමට ඇති එකී ණය නැවත ගෙවීමට බලය ලබා දීමට අවශ්‍ය කටයුතු, හොටෙල් ඩිවෙලොපර්ස් (ලංකා) පෞද්ගලික සමාගම (HDL) විසින් සිදු කරනු ලැබිය යුතු සහ සිදු කරනු ඇත.”

“15. මෙම ගිවිසුම මගින් අරමුණුගත පරිදි ඒ සඳහා අවශ්‍ය වන මූල්‍ය ප්‍රවාහ ප්‍රක්ෂේපණයන් සහ ලාභ ඉපයීම් සහ එකී ගිවිසුමෙහි අංක 1, හිල්ටන් ජාත්‍යන්තරය විසින් එහි හෝටල් කළමනාකරුවන් සහ / හෝ විගණකවරුන් විසින් සකස් කර ඉදිරිපත් කිරීමට, ඒ සඳහා අවශ්‍ය වන පරිදි හොටෙල් ඩිවෙලොපර්ස් (ලංකා) පෞද්ගලික සමාගම (HDL) විසින් සිදු කරනු ලැබිය යුතු සහ සිදු කරනු ඇත.”

ඒ අවස්ථාවේදී අධිකරණ අමාත්‍ය ජී. එල්. පීරිස් විසින් පාර්ලිමේන්තුවේදී සම්පූර්ණයෙන් සාවද්‍ය ප්‍රකාශයක් කළ බව මනාසේ එළිදරව් කරමින්, එවකට එක්සත් ජාතික පක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රී රාජිත සේනාරත්න දීර්ඝ ලෙස කළ ප්‍රකාශය පාර්ලිමේන්තුවේ හැන්සාර්ඩ් වාර්තාවේ ගොනු කර තිබු අතර, අවාසනාවන්ත ලෙස එම දීර්ඝ ප්‍රකාශයට පිළිතුරු දීමට අධිකරණ අමාත්‍ය ජී. එල්. පීරිස්හට නොහැකි විය. එයින් තහවුරු වූයේ, ඔහු විසින් හිතාමතාම ඊර්ෂ්‍යාසහගත, ද්වේෂසහගත සාවද්‍ය ප්‍රකාශයන් ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ සහ ඉන් පිටත සිදු කළ බවය.

## පාර්ලිමේන්තු මන්ත්‍රී රාජිත සේනාරත්නගේ ප්‍රකාශයේ *‘උධෘත’*

“ඔබගේ නියෝජ්‍ය ඇමතිවරුන්ගෙන් කෙනෙකු එවකට ඔබ ගැන කිවේ මෙයයි. ගරු ලක්ෂ්මන් කිරිඇල්ල විසින්, එවකට මහාචාර්ය ජී.එල්.පීරිස් ද ඇතුළත් වූ සුරැකුම් සහ විනිමය කොමිසමේ සාමාජිකයන් හෙලා දැක විවේචනය කළේ එලෙයසි. ගරු කිරිඇල්ල මහතා ඔවුන් ගැන එකල සඳහන් කර ඇත්තේ, ලාභ හිමිකම් සතු වංචාවට පිටුපාන අයවළුන් වශයෙනි. මහාචාර්ය ජී.එල්.පීරිස් සහ එම ක්‍රියාදාමයන් පිළිබඳව ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතාට දැන් කීමට ඇත්තේ කුමක් ද?

මෙම තත්ත්වය හේතුකොටගෙන හිල්ටන් හෝටලය සම්බන්ධයෙන් අමරසේකර මහතා විසින් කළ නොයෙකුත් පැමිණිලි කෙරෙහි ඔවුන්ගේ කල්ක්‍රියාවන් සහ අක්‍රීය භාවය ගැන සුරැකුම් සහ විනිමය කොමිසමේ සාමාජිකයන්ට එරෙහිව රජය විසින් ඉතා නිවැරදිව ක්‍රියා කළයුතු බව කියැවෙන වගන්තියක් 1993 ජුනි මස දී ඔහු විසින් සකස් කර සම්පූර්ණ කළ හිල්ටන් සමථගිවිසුමෙහි කලින් නීතිපති වූ තිලක් මාරපන මහතා විසින් ඉතා හරියාකාරව අඩංගු කරන ලදී. සොලිසිටර් ජනරාල්තුමා විසින් අනුමත කරනු ලැබ, 1995 ජුනි මසදී, මෙම රජය විසින් අත්සන් කරන්නට යෙදුනු හිල්ටන් සමථය ගිවිසුම් හි ද මෙම වගන්තිය ඇතුළත් කර ඇත.

එය එවකට නීතිපතිවරයා මෙන්ම වත්මන් සොලිසිටර් ජනරාල්වරයා විසින් ද පිළිගෙන ඇත. එමනිසා සුරැකුම් හා විනිමය කොමිසමේ අනිකුත් සාමාජිකයන් අතර, මහාචාර්ය ජී.එල්.පීරිස්ට ද එරෙහිව ක්‍රියා කිරිමට බැඳෙමින් මෙම රජය ගිවිසුම් අත්සන් කර ඇත. මෙය වී ඇත්තේ එම කොන්දේසිය ඉතා හරියාකාරව අනුමත කළ කලින් නීතිපතිතුමාගේ සහ වත්මන් සොලිසිටර් ජනරාල්තුමාගේ සැලකිලිමත් මතයට අනුකූලතාවයෙනි. එසේ නොවන බව ගරු කිරිඇල්ල මහතාට කිව හැකි ද?

මහාචාර්ය ජ්.එල්.පීරිස් මෙය දුටුවිට, වියරුවෙන් සහ උමතුවෙන් ඔහු කලේ කුමක් ද? සම්පූර්ණයෙන් වක්‍ර සේයාවක් පෙන්නුම් කිරිමට කෲර ලෙස හිතාමතාම හිල්ටන් සමථය ගිවිසුම්වලින්, සම්බන්ධතාවය බැහැර වූ කුඩා ඡේදයක් පමණක් හුවා දක්වමින්, පා්ර්ලිමේන්තු මන්ත්‍රීවරුන් නොමඟ යැවීම සඳහා අසත්‍ය ප්‍රකාශයක් කළේ ය. හිතාමතාම ඔහු ඡේදයේ සෙසු කොටස් නොකිව්වේය. එසේ නමුත්, සම්පූර්ණ ඡේදය ඔහු ඉදිරියේ විය.”

XXXXXXXXXXXXXXXXXXXXX

> “ඔහුගේ චරියාව සහ ක්‍රියාවන් එළිදරව් කිරීමේ තර්ජනයක් ලෙසට සැලකූ නිහාල් ශ්‍රී අමරසේකර මහතාට මඩ ගැසීමේ සහ නින්දා කිරීමේ අටියෙන් ඔහු වියරුවෙන් එසේ කළේ ය. ඔහු අභියස වූ සම්පූර්ණ සිද්ධාන්ත පූර්නව දැන සිටියදී මහාචාර්ය පීරිස් විවෘතවම දැන් විවේචනය කරන එසේ නම් කරනු ලැබ ඇති ක්‍රමයේම කොටසක් වීමෙන් ඔහු හිතාමතාම පාර්ලිමේන්තුවට අසත්‍ය ප්‍රකාශයක් කර ඇත.
>
> මහාචාර්ය පීරිස් සභාව නොමඟ යැව්වා පමණක් නොව, හිල්ටන් සමඨ ගිවිසුම් මඟින් ඔහුව බෙහෙවින් බලපාන පාර්ශවයක් වන බව ද ඔහු අනාවරණය නොකළේ ය. කිසිදු හෝ ප්‍රකාශයක් කිරීමට පෙරාතුව, මුල් අවස්ථාවේදීම ඔහුගේ බලපෑම සහ සම්බන්ධතාවය පාර්ලිමේන්තුවට අනාවරණය කළයුතු විය.”

මෙම කරුණු මත, කර්තෘගේ නීතිඥවරුන් විසින් අධිකරණ අමාත්‍ය ජී. එල්. පීරිස් වෙත 1997 මාර්තු 27 දින ලිපියක් යොමුකර සිටියත්, එයට පිළිතුරු සැපයීමට ඔහුට නොහැකි විය. එකී පදනම මත කර්තෘ විසින් ඔහුගේ හැසිරීමට හා ක්‍රියාදාමයන්ට එරෙහිව නඩු දෙකක් ගොනු කරනු ලැබුවේ, කර්තෘට අපහාස කිරීමත් සහ හිල්ටන් හෝටලය අයිති සමාගම වූ HDL සමාගමට අලාභ හා හානි කිරීමත් යන කරුණු මුල් කර ගෙනය.

විශ්මජනක ලෙස කර්තෘ විසින් එළිදරව් කර ඇත්තේ, අධිකරණ අමාත්‍ය ජී. එල්. පීරිස් විසින් ඔහුට පනවා තිබූ එක් නඩුවක් අසා සිටි ඔහුගේ පරිපාලන බලය යටතේ නිලය දැරූ කොළඹ අතිරේක දිසා විනිසුරු සමග හොර රහසේ සාකච්ඡා කොට, එම නඩුව නිශ්ප්‍රභා කිරීමට ඉල්ලා සිටී බවය. ඒ ආරංචිය දැනගත් පසු කර්තෘ කඩිනමින් ක්‍රියාත්මක වී, එම නඩුව වෙනත් විනිසුරුවරයෙකුට යොමු කිරීමෙන්, අධිකරණ අමාත්‍ය ජී. එල්. පීරිස් විසින් ගනු ලැබූ එම නිශ්ඵල උත්සහාය නිශ්ප්‍රභා කර ගන්නා ලදී.

ඉහතකී ඔහුගේ ක්‍රියාදාමය නිසා කර්තෘ විසින් අධිකරණ අමාත්‍ය ජී. එල්. පීරිස්ට පැනවූ නඩුවේ විචාරණ වලට පිළිතුරු දීමට ඔහු අපොහොසත් වූ අතර, තවද ඔහු නියෝජ්‍ය මුදල් අමාත්‍යවරයාව සිටි නමුත්, ඔහුගේ බලය සහ පාලනය යටතේ මුදල් අමාත්‍යාංශයේ / මහා භාණ්ඩාගාරයේ පවත්වා ගෙන යන සහ තබා තිබුණු අදාළ ලිපි ගොනු වල සියලු ලේඛනයන් පිළිබඳව දිවුරුම්පතක් මගින් ප්‍රකාශ කර සිටින ලෙසට, සිවිල් නඩු විධිවිධාන සංග්‍රහයේ 102(1) වගන්තිය යටතේ අධිකරණ අමාත්‍ය සහ නියෝජ්‍ය මුදල් අමාත්‍ය වූ ජී. එල්. පීරිස්ට නියෝග කර තිබූ අතර, එසේ වුවත්, ඔහු මෙම කාර්ය මගහැරීමට උත්සාහ දැරුවේය.

ප්‍රතිඵලයක් ලෙස, ජී. එල්. පීරිස් අධිකරණ ඇමති ධුරය දරුවත්, ඔහු යටතේ නිලය දැරූ දිසා අධිකරණයේ නිර්භීත විනිසුරුවරයෙක් වූ සරත් අඹේපිටිය විසින් කර්තෘට ඒකපාර්ෂික නඩුවක් ප්‍රදානයරනු ලැබුවේ, අධිකරණ අමාත්‍ය ජී. එල්. පීරිස්ගේ පිළිතුර කපා හැරීමෙන්ය.

එම ඒකපාර්ශ්වික නියෝගයට බිය වූ අධිකරණ අමාත්‍ය ජී. එල්. පීරිස් විසින් ඉවක් බවක් නොමැතිව අභියාචනාධිකරණයට අභියාචනා ඉදිරිපත් කර තිබුණු අතර, කර්තෘගේ නීතිඥවරුන් අභියාචනාධිකරණයට දැනුම් දී සිටියේ අධිකරණය හමුවේ පාර්ශවකාරයන් අතර සාධාරණ සටනක් කිරීමට බලාපොරොත්තු වන බවයි; ඒ අනුව එම නඩු පාර්ශවකාරයන් අතර විභාග කිරීමට නැවත දිසා අධිකරණයට යොමු කරන ලදී.

මතභේදයට තුඩුදෙන කරුණක් වූයේ, පැමිණිලිකාර කර්තෘ වෙනුවෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ පෙනී සිටි ජනාධිපති නීතිඥ එච්.එල්.ඩී. සිල්වා ශ්‍රේෂ්ඨාධිකරණයේදී ඔහු විසින් ගොනු කළ ලිඛිත ඉදිරිපත් කිරීම් වල වරදකරුවෙකු වූ HDL සමාගමේ විත්තිකාර අධ්‍යක්ෂක ජනාධිපති නීතිඥ කේ.එන්. චොක්සිව තරයේ හෙළා දැක තිබුණත්, ජනාධිපති නීතිඥ කේ.එන්. චොක්සිව බේරා ගැනීමට වංක සහයෝගයෙන් අභියාචනාධිකරණයේදී ක්‍රියා කර තිබුණේ අධිකරණ අමාත්‍ය ජී. එල්. පීරිස් වෙනුවෙන් පෙනී සිටීමයි - *'Colombo Hilton Hotel Construction - Fraud on Sri Lanka Government - Vol. 2 - Criminality Exposed, but Perversely Covered-up'* සාරාංශයෙන් අනාවරණය කර ඇත. මේ සම්බන්ධව පැමිණිලිකාර කර්තෘගේ නීතිඥවරුන් විසින් මේ සම්බන්ධයෙන් ජනාධිපති නීතිඥ එච්.එල්.ඩී. සිල්වා වෙත ලිපි යොමු කර සිටියත්, ඒ සඳහා ඔහුට ප්‍රතිචාර දැක්වීමට නොහැකි විය.

තවද නිකුත් කළ විචාරණ මාලාවන්ට සහ ලිපි ලේඛන සොයා ගැනීමට මෙම නඩු දෙකම ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියට ගොස් තිබූ අතර, සමථය ක්‍රියාවෙහි යෙදවීමෙන් පසු කර්තෘ විසින් ඔහුගේ මෙම නඩු ඉදිරියට ගෙන යාමට ක්‍රියා නොකරන ලදී.

ඉහතකී කරුණු ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියට යාමට ප්‍රථම කොළඹ දිසා අධිකරණයේ අතිරේක දිසා විනිසුරු තිලක් තාවෘ විසින් පරීක්ෂණ පවත්වන ලද අවස්ථාවේදී අධිකරණ අමාත්‍ය ජී. එල්. පීරිස් වෙනුවෙන් පෙනී සිටි ජනාධිපති නීතිඥ රොමේෂ් ද සිල්වා පිළිබඳ පහත දැක්වෙන ඡේදයන් මෙයට අදාළ ග්‍රන්ථයෙන් උපුටා දක්වා ඇත.

“ ඉතා වැදගත් කරුණක් නම් 2000 අගෝස්තු 22 දිනට දින තුනකට පූර්වයෙන්, කොළඹ අතිරේක දිස්ත්‍රික් විනිසුරු තිලක් තාබෘ විසින්, අනොයාන්‍ය ලෙස, මාගේ කොළඹ දිස්ත්‍රික් නඩු අංක 19849/එම්ආර් හි අතුරු විමසුම් වලට, එහි තනි විත්තිකාර ලෙස සිටි, 1 විත්තිකාර, වර්තමාන විදේශ කටයුතු අමාත්‍ය, එවකට අධිකරණ හා නියෝජ්‍ය මුදල් අමාත්‍ය ජී. එල්. පීරිස් විසින් පිළිතුරු ලබා දිය යුතු වූ නමුදු, ඒ සඳහා හිතුවක්කාර නියෝගයක් ලබා දෙන ලදී. (8 වන පරිච්ඡේදය බලන්න)

මාස හතකට පසුව, 2001 මාර්තු මස 25 වැනි දින සන්ඩේ ලීඩර් පුවත් වාර්තාවක මා තැති ගන්වමින් කියවීමට ලැබුවේ, සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමට එරෙහිව අපහාස කිරීමක් සඳහා රු. මිලියන 10 ක් ඉල්ලමින්, උගත් අතිරේක දිස්ත්‍රික් විනිසුරු තිලක් තාබෘ විසින් ඔහුගේ අවශ්‍යතාවය මත කටයුතු කර ඇති අතර, ජනාධිපති නීතිඥ ජේ. රොමේෂ් ද සිල්වා මෙම නඩුව සඳහා පෞද්ගලිකව පෙනී සිට ඇති බවයි. මෙය 1996 දෙසැම්බර් 2 වන දින දිනමිණ සිංහල පුවත් පතෙහි පල වූ ප්‍රවෘත්ති වාර්තාවක් සම්බන්ධයෙනි.”

"ඉන් අනතුරුව, මාධ්‍ය වාර්තා කළ පරිදි මහාධිකරණ විනිසුරු තිලක් තාබෘහට අධිකරණ නිලයෙන් ඉල්ලා අස්වීමට සිදු විය."

ඉහත කී පරිදි, අධිකරණ අමාත්‍ය ජී. එල්. පීරිස්ට අමතරව, එවකට විදේශ ඇමැති ලක්ෂ්මන් කදිරගාමර් විසින් කළ සවද්‍ය ප්‍රකාශයක් පිළිබඳවද කර්තෘ විසින් කරුණු සහිතව දීර්ඝ ලිපියක් 1997.4.8 දින ඔහුට යොමු කර සිටියත්, අධිකරණ අමාත්‍ය ජී. එල්. පීරිස් මෙන්ම විදේශ ඇමැති ලක්ෂ්මන් කදිරගාමර් විසින්ද ඔහුට යොමු කළ ලිපියට පිළිතුරු සැපයීමට අපොහොසත් වීමෙන්, එයින්ද තහවුරු වුයේ පැමිණිලිකාර කර්තෘගේ එම ලිපියේ අඩංගු කරුණු කරණා වල සත්‍යභාවයයි.

අධිකරණ අමාත්‍ය ජී. එල්. පීරිස් සහ විදේශ ඇමැති ලක්ෂ්මන් කදිරගාමර් යන දෙදෙනාම එංගලන්තයේ ඔක්ස්ෆෝර්ඩ් විශ්වවිද්‍යාලයේ ගෞරව විද්වතුන්ව සිටි නමුත්, ඔවුන් විසින් ඉතාමත් නිර්ලජ්ජිත ලෙස රටට සහ ජාතියට සිදුකළ මේ මහාපරිමාණ වංචාව ‘හුදු ආරවුලක්’ ලෙස හැල්ලුවට පත් කළේ, ඉතාමත් නිර්ලජ්ජිත විළිබිය නැති ද්‍රෝහිකාරි නිවටයන් ලෙස ජපන් රටට යටහත් වෙමිනි.

ඉහතකී තත්වය මත, සමථ ගිවිසුම් අත්සන් කිරීමෙන් පසු, එය ක්‍රියාත්මක කිරීම පමා කිරීම හේතුවෙන්, ජපන් රජයේ අසතුට පලකර සිටි අතර, ජපන් රජය විසින් රජයට දැඩි ලෙස බලපෑම් කලේ, 1996 නොවැම්බර් මස පැවැත්වීමට නියමිත ශ්‍රී ලංකා ආධාර රැස්වීමේදී (Aid-Group Meeting) ශ්‍රී ලංකාවට දීමට නියමිත ඩොලර් මිලියන 245 ක් ලබා දෙනු ලබන්නේ මෙම සමථ ගිවිසුම් ක්‍රියාත්මක වූ පසුව බවත්, එසේ ක්‍රියාත්මක නොකළහොත්, එම මුදල ශ්‍රී ලංකා රජයට ලබා නොදෙන ලෙසත් කියාපාමිනි.

මෙම පසුබිම මත, ජනාධිපතිනිය චන්ද්‍රිකා කුමාරතුංගගේ බැගෑපත් ඉල්ලීම මත, මෙම සමථ ගිවිසුම් ක්‍රියාත්මක කිරීමට එවකට භාණ්ඩාගාර ලේකම් බී. සී. පෙරේරා සහ ගරු නීතිපති ජනාධිපති නීතිඥ සරත් එන්. සිල්වා විසින් 1996 ඔක්තෝබර් මස මෙම සමථ ගිවිසුම් වලට පරිශිෂ්ටයක් (*Addendum)* සැකසුවේ කර්තෘගේ එකගතාවයද ලබා ගැනීමෙන්, කර්තෘට රජයෙන් 'පෙර ඉෂ්ට' කරන්නට තිබූ කොන්දේසි, 'පසුව ඉෂ්ටකර' දීමට සත්භාවයෙන් පොරොන්දු වෙමින්ය. කියැවිය යුතු පරිශිෂ්ටයන්-

> "රජය කිසිදු බාධාවක් නොමැතිව ජපානය සමඟ සුහද සබඳතා පවත්වා ගනිමින් කටයුතු කිරීමට අදහස් කර සහ රජය එම ගිවිසුම් ක්‍රියාත්මක කිරීම ප්‍රමාද වීම ගැන සැලකිලිමත් වී ඇත.
>
> මෙම තත්වය තුල, රජය, අමරසේකර මහතාගේ කැමැත්ත සහ එකඟතාවය මත, දැන් මෙහි විශේෂයෙන් ලබා දී ඇති ගිවිසුම් අංක 3 සහ 4 හි නියම කර ඇති කොන්දේසි සම්පූර්ණ කිරීමක් නොමැතිව, එම ගිවිසුම් අංක 1 සහ 2 ක්‍රියාත්මක කර ගෙන යාම සඳහා එකඟ වී ඇත. රජය විසින්, ගිවිසුම් අංක 3 සහ 4 යටතේ වන අන්තර්ගතයන් ක්‍රියාත්මක කිරීම සඳහා අදාල නීතිමය තත්වයන් යටතේ අවසර ගෙන පරිපාලන කටයුතු සිදු කිරීමට කටයුතු කරනු ඇති බවට පාර්ශවයන් අතර අවබෝධ කර ගෙන ඇත. "

ඒ අනුව, එම පරිශිෂ්ටයට (*Addendum*) රජය වෙනුවෙන් භාණ්ඩාගාර ලේකම්, කර්තෘ, ජපානයේ මිට්සුයි සහ තායිසේ සමාගම් විසින් අත්සන් කර තිබුණි.ඒ අනුව ශ්‍රී ලංකා රජයෙන් කර්තෘට කළ ආයාචනයන් සහ අයැදීම් මත, 1996 නොවැම්බර් මස පැවැත්වීමට නියමිතව තිබූ ශ්‍රී ලංකා ආධාර රැස්වීමට (Aid-Group Meeting) ප්‍රථම කර්තෘගේ නඩු දෙක ඉල්ලා අස්කර ගන්නා ලද්දේ රජයේ ඉල්ලීම මතය.

ඉහතකී කර්තව්‍යයට රජය වෙනුවෙන් එවකට භාණ්ඩාගාර නියෝජ්‍යලේකම් ආචාර්ය පී. බී. ජයසුන්දර සෘජුවම පැමිණිලිකාර කර්තෘගෙන් බැගෑපත් ලෙස ඔහුගේ නඩු ඉල්ලා අස්කර ගැනීමට ඉහත සඳහන් පරිදි ආයාචනා කර සිටි අතර, ඉහත සමථකාරණය සඳහා 1996.10.25 දින පැවති HDL සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීමේදී ඔහු මුලසුන හෙබවමින් එම කාර්ය සටහන් වල මෙසේ වාර්තා කර තිබුණි.

> "මෙම මණ්ඩල රැස්වීම පවත්වනු ලබන්නේ, රජයේ න්‍යාය පත්‍රයට අනුව, ජාතික වැදගත්කමක් ඇති ප්‍රශ්නයක් වන ශ්‍රී ලංකාව සහ ජපානය අතර මිත්‍රශීලී බව ඉදිරියට ගෙන යාමට රජය වෙනුවෙන් ක්‍රියා කරන බව යන්න සභාපති, ආචාර්ය පී. බී. ජයසුන්දර මහතා විසින් දැනුම් දී ඇත. අනිකුත් සියළු දෙනා එකඟ විය"

ඉන්පසු පමිණිලිකාර කර්තෘ විසින් නඩු ඉල්ලා අස්කර ගත් විගස, කර්තෘ විසින් ලබාගෙන තිබුණු අතුරු තහනම් නියෝග වල ප්‍රතිඵලයක් මත, හිල්ටන් හෝටලය අයිති සමාගමක් වූ HDL සමාගමේ එකතුවී තිබූ ඩොලර්

මිලියන 30, ජපන් රජයේ අවශ්‍යතාවය මත 1996 නොවැම්බර් මස පැවැත්වීමට නියමිතව තිබූ ශ්‍රී ලංකා ආධාර රැස්වීමට (Aid-Group Meeting) ප්‍රථම වහාම ඩොලර් මිලියන 29 ක ගෙවීමක් ජපන් සමාගම් වෙත කරන ලදී.

මිට අමතරව, රජයෙන් නොව, හිල්ටන් හෝටලය අයිති සමාගමක් වූ HDL සමාගම විසින් ඉතිරි කපා නොහැරිය ණය ශේෂයට අවුරුදු 16ක් තුල කොටස් වශයෙන්, 5.25% ක අඩු පොලියකට ගෙවීමට පොරොන්දු පත්‍ර නිකුත් කරන ලදී.

මෙහි ප්‍රතිඵලයක් වශයෙන්, HDL සමාගම තවදුරටත් මූල්‍ය වශයෙන් ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා බේරුම්කරණ ගිවිසුම් වල අඩංගු කර තිබූ කොන්දේසි සී.වී. විග්නෙශ්වරන් විසින් අභියාචනාධිකරණයේ සැක සහිත ලෙස මැඩ පවත්වා, අභිරහස් අන්දමින් එම බේරුම්කරණ ගිවිසුම් වලට අනුව මෙමෙ ජපන් සමාගම් වෙත කළ යුතු ගෙවීම නිදහස් කර හැරීමෙන් HDL සමාගම බංකොලොත් තත්වයකට පත් කළේය.

පොතෙන් උපුටාගත් - විනුසුරු C.V. විග්නේෂ්වරන්ගේ විනිශ්චයේ *'උධෘත'*

"අභියාචනාධිකරණය විසින්, එස්සී අභියාචනා අංක 33 සහ 34/1992 මත ශ්‍රේෂ්ඨාධිකරණය විසින් සිදු වී ඇති බවට පිළිගනු ලැබූ වංචාව සම්බන්ධව, හොටෙල් ඩිවර්ලොපර්ස් (ලංකා) සමාගම සහ එහි ඇපකරු වශයෙන් ශ්‍රී ලංකා රජය මත සිදුවූ අදාළ එම වංචාව පිළිබඳව සම්පූර්ණයෙන්ම නොදුටු සේ සළකා කටයුතු කර ඇත.

එකී හිතුවක්කාර විනිශ්චය මගින්, අභියාචනාධිකරණය විසින් බේරුම්කරණ කොන්දේසි සමස්ථයම වාරණය කරන අතර එහෙත්, කෙසේ වෙතත්, සැළකිය යුතු ලෙස, පහත කරුණු සඳහන් කරමින්, මිට්සුයි සහ සමාගම වෙත සහ තායිසෙයි සමාගම වෙත අඩුකල මුදලේ එකතුව ගෙවීම සඳහා පුදුම සහගත අයුරින් අවසරය ලබා දෙන ලදී. (එනම්, එකී බේරුම්කරණ ගිවිසුම අනුව, කපා ඉවත් නොකල ප්‍රති සැකසූ වටිනාකම) ;

> "ජනාධිපති නීතිඥ සිවරාසා මහතා විසින්, මෙම අධිකරණය විසින් මෙම කරුණ සම්බන්ධයෙන් බේරුම්කරණය සිදු කල හැකි අවස්ථාවන් විපරම් කරන අතරතුර, අධිකරණය වෙත සඳහන් කරනු ලැබුවේ, පි6, පි12 සහ පි13 යටතේ ඔහුගේ සේවා දායකයාගේ අයිතිය ආරක්ෂා වන පරිදි, ජපන් සමාගම වෙත ගෙවිය යුතු වටිනාකම් ලැබීම පිළිබඳව කිසිදු විරෝධතාවයක් නොමැති බවයි."

ඉහතින් සඳහන් කරුණු මගින්, කොනල් සහ සමාගම වෙනුවෙන් පෙනී සිටින ජනාධිපති නීතිඥ සිවරාසා මහතා විසින්, මිට්සුයි සහ සමාගම වෙත සහ තායිසෙයි සමාගම වෙත ගෙවීම් සිදු කිරීම සම්බන්ධයෙන් යෝජනා කිරීම සඳහා අභිප්‍රේරණය වූයේ කුමක් නිසාද සහ අභියාචනාධිකරණයේ විනිසුරු සී. වී. විග්නේශ්වරන් බේරුම්කරණ ගිවිසුම් පිළිබඳ මහත් කැමැත්තෙන්, සැළකීමකින් තොරව ඔවුන්ගේ සාකල්‍ය තුල, බේරුම්කරණ ගිවිසුම් එකක්

අනිකට සම්බන්ධව සහ එක් සංයෝජිත ගිවිසුමක් ලෙස පෙන්නුම් කරන අයුරින් සළකා, ඒ සඳහා එකඟ වූයේ කුමක් නිසාද යන්න පිළිබඳව, කුතුහලය දනවන ප්‍රශ්නයක් මතු විය.?

මෙහි බේරුම්කරණයක් නොමැති අතර, මේ සම්බන්ධයෙන් තනි වගකීම සහිත වූ මිට්සුයි සහ සමාගම වෙත සහ තායිසෙයි සමාගම වෙත ගෙවීම් සිදු කිරීම සඳහා අවසර ලබා දෙමින් අභියාචනාධිකරණය විසින් ලබා දුන් ඒකාපාර්ශ්වික අත්තනෝමතික නියෝගයක් පවතී. එමගින් වන ප්‍රතිවිපාක එකී අභියාචනාධිකරණ විනිසුරු සී. වී. විග්නේශ්වරන් සහ කෝනල් සහ සමාගම වෙනුවෙන් පෙනී සිටින නීතිඥ, ජනාධිපති නීතිඥ එස්. සිවරාසා මත පිහිටා තිබෙන අතර, ඒ මගින්, මා විසින් ස්ථිරවම විරුද්ධ වූ, එවැනි හිතුවක්කාර නියෝගයක ප්‍රතිඵලය ලෙස, හොටෙල් ඩිවර්ලොවර්ස් (ලංකා) සමාගම ආනුශංගික අනතුරු සහගත තත්වයකට පත්ව ඇත.

හොටෙල් ඩිවර්ලොවර්ස් (ලංකා) සමාගමෙහි ප්‍රතිව්‍යුහගත කිරීම හස එමගින් එහි ලාභදායිතාවය සහ ණය - සේවා හැකියාව වැඩි දියුණු කිරීමද ඇතුලත්ව, සමස්ථ බේරුම්කරණය මගින් බලපාන පරිදි කටයුතු කිරීමක් නොමැතිව, කුමක හෝ ආකාරයක එවැනි ඕනෑම ගෙවීමක් අරමුණු කර, කතෘ විසින් සහ හොටෙල් ඩිවර්ලොවර්ස් (ලංකා) සමාගම විසින් අදාළ ලේඛන අමුණමින්, ගෙනහැර දැක්වූ විස්තරාත්මක විරෝධතා ප්‍රකාශය නොසළකා, ඉහත සඳහන් කුතුහලය දනවන විනිශ්චය ලබා දීමට කටයුතු කර ඇත.

කුතුහලය දනවන ලෙස, එකී විස්තරාත්මක විරෝධතා ප්‍රකාශය සම්බන්ධිත මොනම අයුරක හෝ සම්බන්ධකමක් අභියාචනාධිකරණ විනිශ්චයෙහි නොවූ අතර, එසේ තිබියදීත්, අභියාචනාධිකරණය ඉදිරියේ එකී කරුණ සම්බන්ධව වාරණ නියෝගයන් අන්‍යෝන්‍ය ලෙස, අතුරු තහනම් නියෝගය ප්‍රදානය කිරීමට සළකා බැලුණි.

XXXXXXXXXXXXXXXXXXXXXXX

එහෙත්, සොලිස්ටර් ජනරාල් ජනාධිපති නීතිඥ ඩග්ලස් ප්‍රේමරත්නගේ සහාය ඇතිව, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් මූලික විමර්ශනයන් සිදු කිරීමෙන් අනතුරුව, විශේෂ ජනාධිපති කොමිෂන් සභාව විසින් පුද්ගලයින් 4 දෙනෙකු වෙත හේතු දැක්වීමේ දැන්වීම් නිකුත් කර, අනෙකුත් කරුණු අතරතුර, ශ්‍රී ලංකා රජයට එරෙහිව වංචාවක් සිදුවූ තත්වය මත, (Colombo Hilton Hotel Construction - Fraud on Sri Lanka Government – Vol. 2 – Criminality Exposed but Perversely Covered-up – by Same Author) සහ අභියාචනාධිකරණය ඉදිරියේදී එම හේතු දැක්වීමේ දැන්වීම් එකී විරෝධතා දැක්වීමේ ප්‍රකාශයන්හිම කොටසක් වශයෙන් භාර ගන්නා ලෙස සඳහන් කර ඇත.

අතුරු තහනම් නියෝගය ප්‍රදානය කිරීම සම්බන්ධයෙන් වන කාරණයේදී එනම් වාරණ නියෝගයන්හිදී, ප්‍රතිශෝධිත අයැදුම් අංක 721/98, 728/98 සහ 738/98 පමණක් විභාග කිරීමෙන් අනතුරුව, අභියාචනාධිකරණය විසින් එහි විනිසුරු සී. වී. විග්නේශ්වරන් විසින් ලියනු ලැබූ එකී විනිශ්චය මගින්, වඩාත් තැතිගන්වන සුළු ලෙස, මොනම අයුරක කිසිදු විභාග කිරීමක්වත් සිදු නොකර, කිසිදු අවස්ථාවක සළකා නොබැලූ අභියාචනා අයැදුම් සඳහා අනුමැතිය ලබා දීමට කටයුතු කරනු ලැබීය. එයින් පැහැදිලිව සහ වඩාත් සත්‍ය ලෙස විනිසුරු සී. වී. විග්නේශ්වරන්හට සැඟවුණු න්‍යාය පත්‍රයක් පැවති බවට ආදර්ශනය කෙරේ. පසුව, ශ්‍රේෂ්ඨාධිකරණය විසින් එවැනි හිතුවක්කාරී අගතියක් මතු කර දක්වමින් අභියාචනය සඳහා විශේෂ අනුමැතියක් ප්‍රදානය කරන ලදී.”

ඉහත සඳහන් පරිදි අත්ව තිබූ මහත් ආපදාකාරී තත්වයන් මත, හිල්ටන් හෝටල් සමාගම 2007 අංක 7 දරණ සමාගම් පනතේ වගන්ති වලට අනුව, එම සමාගම ඈවර කළ යුතු බව නීතියෙන් බල කිරීම නිසා, කර්තෘ විසින් එසේ ඈවර කිරීමට නඩු පවරා, එවකට හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂව ඒ අනුව දැනුවත් කරනු ලැබුවත්, ඔහු සමාගම් පනතේ වගන්ති වලට පටහැනිව, එවකට භාණ්ඩාගාර ලේකම් පී. බී. ජයසුන්දරට අනුමැතිය දී තිබුණේ, ඈවර කිරීමට නීත්‍යානුකූලව කටයුතු නොකර, එයට විරුද්ධ වන ලෙසය.

එනමුත් ඉන් අනතුරුව, එම අධිකරණ බලය ක්‍රියාත්මක වන අවස්ථාවේදී, ශ්‍රේෂ්ඨාධිකරණය ශ්‍රී ලංකා රජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කරමින් විශේෂ තීරණය කිරීමත් සමග, හිල්ටන් හෝටල් සමාගම රජයට අත්පත් කර ගැනීම සඳහා ඉතා ඉක්මනින් ඒකපාර්ශිකව පුද්ගල ආලම්භන නීතියක් 2011 නොවැම්බර් මසදී ඉතා කඩිමුඩියේ බලාත්මක කරන ලද්දේ, ජනාධිපති මහින්ද රාජපක්ෂ විසින් මුදල් අමාත්‍යවරයා ලෙස පාර්ලිමේන්තුවට ගෙනන් ලද පනතක් මගින් HDL සමාගමේ සියලු කොටස් භාණ්ඩාගාරයේ ලේකම් වෙත පැවරීමත් සහ භාණ්ඩාගාරය වෙත ලැබිය යුතු රු.මි. 12,098.6 සහ වැල් පොලියව රු.මි. 8,148.7 ක් තිබූ අතර එහි ප්‍රාග්ධන රු.මි. 3,949.9 පමණක් වී තිබූ අවස්ථාවකය.

1983 වර්ෂයේ ‘කළු පුලි’ කෝලාහලයට පසු, ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර ප්‍රතිරූපය ම්ලේච්ඡ ලෙස විවේචනයට ලක්වීම නතර කිරීමට සහ ශ්‍රීලංකාවේ නාමය නැවත කීර්තිමත් තත්වයකට නැංවීමට, ව්‍යාපෘතියක් කොළඹ ස්ථාපිත කිරීමට එවකට රජයේ උනන්දුව සහ අනුග්‍රහයත්, එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී ජපන් සමාගම් විසින් සිදු කළ මහාපරිමාණ වංචාවන්ට එරෙහිව, කර්තෘ විසින් නීතිමය පියවර ගෙන, දැඩි පීඩන සහ විරෝධතා මධ්‍යයෙහි ජයග්‍රහණය ලබාගත් ආකාරයත්, අවසානයේ රාජතාන්ත්‍රික බලපෑම් වලට යටත් වීමෙන් සමථයකට පත්කර ගැනීමට සිදුවීමත්, මෙම ග්‍රන්ථයෙන් මනාසේ හෙළිදරව් කර ඇති අතර, මෙම ග්‍රන්ථය පිළිබඳ වැඩි විස්තර පහත සඳහන් පටුනෙන් එළිදරව් වේ.

කර්තෘ ඔහුගේ ජීවිතය පරදුවට තබා, ඔහුගේ මූලධර්මයන්ට අනුව කළ අරගලය ඔස්සේ, සමාජයේ ඉහළම තනතුරු දරන්නන්ට එරෙහිව මහා පරිමාණ දූෂණ වංචා ගැන ක්‍රියා කර ඇත්තේ ද්වේෂ සහගත සහ අත්තනෝමතික ක්‍රියාවන්ට මුහුණ දෙමිනි. එනම්: මුදල් අමාත්‍යාංශයේ සටහන් සමහරක් -

"ලේ/හා    අති. නි. ලේ. හා

එෆ් (60) හි වන ඔබගේ සටහනට යොමුව පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කිරීමට කැමැත්තෙමි.

දිස්ත්‍රික් අධිකරණයේ ආසන්නතම තීරණය අනුව, වංචාවේ තත්වය යටතේ, රජයේ ඇපකරුවන් ශුන්‍ය සහ බල රහිත බව, එක්සිම් බැංකුව ඇතුළුව අදාළ පාර්ශවයන් වෙත දැන්වීමට කටයුතු කරන ලෙසට නිහාල් අමරසේකර මහතාගේ නීතිඥයින් විසින් ගරු. නීතිපතිගෙන් ඉල්ලීමක් කරනු ලැබ ඇත.

එම ඉල්ලීමෙහි කිසිදු අයුරක වටිනාකමක් නොමැති අතර, කෙසේ වුවත්, අමරසේකර මහතාගේ නීතිඥයින් විසින් ගරු නීතිපති වෙත ඔහුගේ වගකීම් සහ යුතුකම් සිහි කර දීමේ අවශ්‍යතාවයක් නොමැත. යම් හෙයකින් වංචාව සනාථ වුවහොත් ඇපකරුවන් ශුන්‍ය සහ බල රහිත වන බව, රජය විසින් අත්සන් කරනු ලැබූ ඇපකරු සහතිකයේ පැහැදිලිව ප්‍රකාශ කර ඇත. එබැවින්, මෙම සාධක සම්බන්ධයෙන් සැළකිලිමත් වන පාර්ශවයන් වෙත කිසිවකු විසින් සිහි කිරීමේ අවශ්‍යතාවයක් නොමැත.

මා මේ පිළිබඳව ශිබ්ලි අසීස් මහතා සමඟ සාකච්ඡා කරන ලද අතර,ඔවුන්ට ගත හැකි ක්‍රියාමාර්ගයක් නොමැති බැවින් ඔවුන් මෙම ලිපිය ප්‍රතික්ෂේප කරන බව ඔහු මා වෙත දන්වන ලදී.

අමරසේකර මහතා විසින් යොමු කරනු ලැබූ ආසන්නතම ලිපි වලින්, ඔහු මෙම ආසන්න විනිශ්චය පිළිබඳ සීමාව ඉක්මවා ප්‍රතික්‍රියා කරන බව පෙන්නුම් කරයි.කරුණාකර, දිස්ත්‍රික් විනිසුරු විසින් පිටු අංක (1) සහ (2) හි, (ඒ) සිට (එල්) දක්වා නිරීක්ෂණය කරන ලද බව ඔහු විසින් ප්‍රකාශ කරන 1991 නොවැම්බර් 8 දිනැති එෆ්(59) ලිපිය බලන්න. මෙම සාධකයන් විනිශ්චයෙහි සඳහන් කර ඇති බව සත්‍යයක් වන නමුත්, එසේ සිදු කිරීමෙන් විනිසුරු විසින් අමරසේකර මහතා විසින් සිදු කල සම්ප්‍රකාශයන් හුදු නැවත දැක්වීමක් පමණක් සිදු කර ඇති අතර, ඔහු විසින් කිසිදු නිගමනයකට ලගා වී නොමැත.පැමිණිලිකරු විසින් සිදු කල සම්ප්‍රකාශයන් පරිදි, ජපාන සමාගම් වෙත අදාළ මුදල් ගෙවීම සිදු කිරීම මගින්, රටට සිදු වන අලාභයකට එය හේතු වනු ඇත්දැයි යන්න පිළිබඳව හුදු සළකා බැලීමක් පමණක් විනිසුරු විසින් සිදු කර ඇති අතර, සහ මුදල් වෙනත් රටකට යැවීම සිදු කලහොත් හානියක් සිදු වන බව නිගමනය කරන ලද අතර, එබැවින්, අතුරු තහනම් නියෝගයක් බල පැවැත්විය යුතු බව තීරණය කරන ලදී. එසේම අවසාන තීරණය ණය දෙන්නන්ගේ කැමැත්ත අනුව සිදු වුවහොත්, ණය දෙන්නන් හට ප්‍රමාණවත් පොළියක් සමඟ හිලව් කිරීමට සිදු වන බවත් විනිසුරු විසින් නිරීක්ෂණය කරන ලදී.

ජපන් සමාගම් විසින් දිස්ත්‍රික් අධිකරණ විනිසුරුගේ තීරණයට එරෙහිව අභියාචනය කලද, ඔවුන් වෙත සිදු කල යුතු කිසිදු ගෙවීමක් නොමැත.

එය ආරවුල සිදුවූ ඉදිකිරීමෙහි එක් කොටසක් පමණක් වන බවට වන සාධක අනුව,කිසිදු ගෙවීමක් සිදු විය යුතු නොවේ යන විනිසුරුගේ තීරණය අසාධාරණ බව පෙනී යයි. අප විසින් ජපාන සමාගම් හි අභියාචනයට සහාය දැක්විය යුතුය යන්න අසීස් මහතාගේද අදහස වේ. ඔහු විසින් කරුණු අධ්‍යයනය කර නැවත අප වෙත වාර්තා කරනු ඇත. ගරු. නීතිපති විසින් අභියාචනයට සහාය දැක්වීම සළකා බලන්නේ නම්, අභියාචනයට සහාය දැක්වීම යුක්තිසහගත බව මා සිතමි.

අප විසින් ජපන් සමාගමට සහාය දැක්විය හැකි අනෙකුත් ක්‍රමය නම්, සංශෝධිත ආයෝජන සහ කොටස් පැවරුම් ගිවිසුම් අත්සන් කිරීම ඉක්මන් කරවීම මගින් රජයේ ස්ථාවරය ශක්තිමත් කිරීමයි. කරුණාකර, මෙම කරුණ සම්බන්ධයෙන් වන සටහන් අංක 13, 14, 15 සහ 16 හි සටහන් බලන්න.

*(අත්සන)*
91/11/20″

M.
20/11/91

ST

(1) I am informed that Mr. A is trying to get the Company de listed from the Stock Exchange. This has to be stopped.

(2) We may re-assure the Japanese that our guarantee of the loan will be honoured, in terms of the rescheduling we have agreed to.

(3) Request A.G to take a fair view of the submission and support the Japanese firm to the extent possible, in their appeal to the Supreme Court. I think we should take a positive stand on this. [signature]

[signature] 22/11

Pl. arrange with Mr. Chidley and map out our strategy. The UDA Director tell me that the building is in accordance with the plans. The UDA had issued the certificate of conformity. The UDA can give evidence. This must be settled pl. [initials] 22/11.

DEA

Pl. arrange a meeting as indicated by S/T above [initials]

[signature]

3/30 on 27th